ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# Department of Pensions

## වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්
## வருடாந்த செயற்பாட்டு அறிக்கை மற்றும் கணக்குகள்
## ANNUAL PERFORMANCE REPORT & ACCOUNTS

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2018

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව


| | | |
|---|---|---|
| දුරකථන | : | 011-2209800 |
| ෆැක්ස් | : | 011-2342078 |
| ඊ-මේල් | : | info@pensions.gov.lk |
| අන්තර්ජාල ලිපිනය | : | www.pensions.gov.lk |

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | **1 - 4** |
| 01. 1. | හැඳින්වීම | 1 |
| 01. 2. | දැක්ම හා මෙහෙවර | 2 |
| 01. 3. | සංවිධාන සටහන | 3 |
| 01. 4. | අනුමත කාර්ය මණ්ඩලය | 4 |
| 02. | දෙපාර්තමේන්තු ක්‍රියාවලිය | **5 - 8** |
| 02. 1. | ලියාපදිංචිය | 5 |
| 02. 2. | ගෙවීම් නියාමනය | 5-6 |
| 02. 3. | ලැබීම් නියාමනය | 6-7 |
| 02. 4. | සංවර්ධන ප්‍රවේශය | 7-8 |
| 02. 5. | පසු විපරම | 8 |
| 03. | වාර්ෂික වැඩසටහන් | **9 - 14** |
| 03. 1. | ජාතික විශ්‍රාමික දින සැමරුම | 9 |
| 03. 2. | තාක්ෂණික සැසිය | 10 |
| 03. 3. | අභ්‍යන්තර පුහුණු සහ විදෙස් පුහුණු අවස්ථා කළමනාකරණය | 11-12 |
| 03. 4. | දැනුම් කළමනාකරණය | 12-13 |
| 03. 5. | බැහැරගත ක්‍රියාකාරකම් | 13-14 |
| 04. | නව හඳුන්වාදීම් | **15 - 16** |
| 04. 1. | භෞතික වැඩිදියුණු කිරීම් | 15-16 |
| 04. 2. | විෂය මූලික වැඩිදියුණු කිරීම් | 16 |
| 05. | සාධනයන් | **17** |

| | | | |
|---|---|---|---|
| 06. | විශ්‍රාම වැටුප් ගෙවීම් | | **18 - 26** |
| | 06. 1. | වාර්ෂික විශ්‍රාමිකයින් සංඛ්‍යාව | 18-22 |
| | 06. 2. | පාරිතෝෂික ගෙවීම් | 22-23 |
| | 06. 3. | හිඟ වැටුප් ගෙවීම් | 24 |
| | 06. 4. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් හා ගෙවීම් | 25 |
| | 06. 5. | ගොඩනැගිලි කුලී ලැබීම් හා නිවාඩු නිකේතන ආදායම් | 26 |
| 07. | මූල්‍ය ප්‍රකාශන | | **27 - 44** |
| | 07. 1. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 28 |
| | 07. 2. | වැඩසටහන් අනුව වියදම් සාරාංශය | 29 |
| | 07. 3. | වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය | 30 - 32 |
| | 07. 4. | වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය | 33 |
| | 07. 5. | පළාත් පාලන සේවා ගිණුම් | 34 - 38 |
| | 07. 6. | සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා හා මධ්‍යම රජය) | 39 - 40 |
| | 07. 7. | ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම් | 41 - 42 |
| | 07. 8. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අවසන් ගිණුම් | 43 - 44 |
| 08. | විගණකාධිපති වාර්තා | | **45 - 84** |

# 01. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

## 01. 1. හැඳින්වීම

බ්‍රිතාන්‍ය යටත් විජිත ආණ්ඩුව විසින් ශ්‍රී ලාංකේය රාජ්‍ය සේවකයන්ට හඳුන්වා දුන් දැවැන්ත සමාජාරක්ෂණ වැඩ පිළිවෙල වන රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආරම්භය වසර 1900 පමණ දක්වා වූ අතීතයකට දිවෙන්නකි. එහෙත් රාජ්‍ය සේවකයාගේ වියෝවෙන් ආර්ථික හා සමාජයීය වශයෙන් අසරණභාවයට පත්වන වැන්දඹුව හා අනත්දරුවන් වෙනුවෙන් වූ සමාජාරක්ෂණ ක්‍රමයක් ඊට පෙර තිබූ බවට සාක්ෂි සපයන්නේ 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනතයි. මෙම පනත සහ වර්ෂ 1934 පෙබරවාරි මස 05 දින ස්ථාපිත කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යන නෛතික ලියවිලිවලින් බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවාවේ විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ශ්‍රී ලංකා රජයේ නීතියක් ලෙස නීතිමය වශයෙන් ස්ථාපිත වන්නේ ය.

1934 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අවස්ථා ගණනාවකදී සිදු කරන ලද සංශෝධනයන්ට හා 1972 මැයි මස 05 දින සිදු කරන ලද සංශෝධනයන්ට යටත්ව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක වේ.

එමෙන්ම 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් පනත ද 1981 අංක 44 දරණ වැන්දඹු හා අනත්දරු අරමුදල් සංශෝධන පනත යටතේ ආබාධිත විශ්‍රාම වැටුප් ක්‍රමය ඇතුලත් කරමින් ප්‍රතිලාභ අවස්ථා පුළුල් කිරීම සිදු වී වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක වේ. මෙකී සංශෝධනයන්ට යටත්ව 2010 අංක 08 සහ 09 දරණ පනත් සංශෝධනයන්ගෙන් තවදුරටත් වැන්දඹු හා අනත්දරු සහ ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පුළුල් වී ඇති අතර දැනට ක්‍රියාත්මක වන්නේ එකී පනතයි.

එමෙන්ම 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත ප්‍රකාරව ක්‍රියාත්මක වන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ද මීට සමගාමීව රාජ්‍ය සේවයේ ම තවත් සේවක පිරිසකගේ සමාජාරක්ෂණ ක්‍රියාවලිය සවිබල ගන්වයි.

මෙකී විෂය ත්‍රිත්වය නීති ප්‍රකාරව ක්‍රියාත්මක කිරීම උදෙසා වසර 1970 දෙසැම්බර් 23 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වන A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

## දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්

## මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

# සංවිධාන සටහන




වි.වැ.නි - විශ්‍රාම වැටුප් නිලධාරි
අ.ස - අයවැය සහකාර
ලේ.ස - ලේඛණ සහකාර
කා.සේ.සේ. - කාර්යාල සේවක සේවය

ස.නි - සංවර්ධන නිලධාරි
රා.ක.ස - රාජ්‍ය කළමනාකරණ සහකාර
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරි
බ.හා. - බංගලා භාරකරු

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය-2018.12.31දිනට

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 0 | 1 |
| | වෛද්‍ය නිලධාරී | Primary Grade | SL-2-2016 | 1 | 0 | 1 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL-1-2016 | 4 | 3 | 1 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS(Class II or III) | SL-1-2016 | 10 | 9 | 1 |
| | ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ගණකාධිකාරී | SLAcS(Class II or III) | SL-1-2016 | 9 | 6 | 3 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLITS(Class II or III) | SL-1-2016 | 1 | 0 | 1 |
| | නීති නිලධාරී | Dept | SL-1-2016 | 1 | 0 | 1 |
| | Software Developer | Dept | Contract | 3 | 2 | 1 |
| | | | | **34** | **24** | **10** |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN-7-2016 | 4 | 1 | 3 |
| | භාෂා පරිවර්තක සිංහල - ඉංග්‍රීසි 01<br>සිංහල - දෙමළ 01 | TS | MN-6-2016 | 2 | 2* | 0 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICTS | MN-6-2016 | 5 | 2 | 3 |
| | | | | **11** | **5** | **6** |
| ද්විතීය මට්ටම | කාර්මික නිලධාරී | SLTS | MN-3-2016 | 1 | 0 | 1 |
| | අයවැය සහකාර | RS | MN-4-2016 | 1 | 1 | 0 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Dept. | MN-4-2016 | 340 | 244 | 96 |
| | සංවර්ධන නිලධාරී | DOS | MN-4-2016 | 398 | 395 | 3 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | MN-2-2016 | 190 | 178 | 12 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICTS | MT-1-2016 | 5 | 2 | 3 |
| | ලේඛණ සහකාර | Dept. | MN-1-2016 | 141 | 123 | 18 |
| | Help Desk Operator | Dept. | Contract | 2 | 0 | 2 |
| | | | | **1078** | **943** | **135** |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept. | PL-1-2016 | 2 | 1 | 1 |
| | අරක්කැමි / උද්‍යාන කම්කරු | Dept. | PL-1-2016 | 4 | 3 | 1 |
| | රියදුරු | DS | PL-3-2016 | 12 | 10 | 2 |
| | විදුලි කාර්මික | Dept. | PL-3-2016 | 1 | 0 | 1 |
| | කාර්යාල කාර්ය සහායක | OES | PL-1-2016 | 56 | 43 | 13 |
| | | | | **75** | **57** | **18** |
| **එකතුව** | | | | **1198** | **1029** | **169** |

*භාෂා පරිවර්තක - සේවයේ නියුතු සේවක සංඛ්‍යාව :- සිංහල - ඉංග්‍රීසි - 01
ඉංග්‍රීසි - දෙමළ - 01

## 02. දෙපාර්තමේන්තු ක්‍රියාවලිය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ථ කාර්යභාරය ලියාපදිංචිය, ගෙවීම් නියාමනය, ලැබීම් නියාමනය හා සංවර්ධන ප්‍රවේශය යන ක්‍රියාවලි 4 ක් ඔස්සේ සිදුවන අතර මෙම ක්‍රියාවලි පවත්වා ගැනීමේ පහසුව සැලසෙන පරිදි විවිධ අංශයන් ඔස්සේ පරිපාලනය කරනු ලබයි.

### 02. 1. ලියාපදිංචිය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිලාභ හිමිකර ගන්නා සියලු ප්‍රතිලාභීන් ලියාපදිංචි කර අනන්‍යතාව තහවුරු වන පරිදි විධිමත් ලෙස ගෙවීම් හා අයකිරීම් සිදු කිරීම සඳහා අදාල තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම හා විශ්‍රාම වැටුප් අංක ලබාදීම ඇතුළු අවශ්‍ය මූලික පියවරයන් ගනු ලබන්නේ ලියාපදිංචි ක්‍රියාවලිය ඔස්සේය.

දිවයින පුරා සියලු රාජ්‍ය සේවකයින් හා සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා කාලය අවසන් වීමෙන් විශ්‍රාම ලැබීම සඳහා ලියාපදිංචි වීම මෙන්ම සංශෝධිත විශ්‍රාම වැටුප්, විශේෂ වන්දි සහ වන්දි විශ්‍රාම වැටුප් සඳහා වන ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය මාර්ගගතව ලියාපදිංචි අංශයෙන් සිදු කෙරේ.

සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවයේ යෙදී සිටියදී සිදුවන මිය යාමකදී උරුමකරුවන් වෙත ගෙවන මරණ පාරිතෝෂික ප්‍රතිලාභය සඳහා ලියාපදිංචි කිරීම සිදු වන්නේ ද ලියාපදිංචි අංශය මඟිනි.

එමෙන්ම පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු, 2006.01.02 දිනට පෙර විශ්‍රාම ලැබූවන්, අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ලබන්නන්, විනය හේතූන් මත විශ්‍රාම ගැන්වූවන් යන විමධ්‍යගත නොකළ කාණ්ඩයේ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සඳහා ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම හා අදාල කාර්යයන් ගණන් බැලීම් අංශය මගින් සිදු කෙරේ.

එමෙන්ම සියලුම රාජ්‍ය සේවකයන් රාජ්‍ය සේවයට ඇතුළත් වීමත් සමඟම වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ලියාපදිංචි වීම අනිවාර්ය කාර්යයකි. මාර්ගගත දත්ත පද්ධතියක් ඔස්සේ අදාල රාජ්‍ය නිලධාරියා සේවය කරන ආයතනය මගින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතියට පිවිස වැන්දඹු හා අනත්දරු අංක ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත. එමෙන්ම රාජ්‍ය සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ද, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයන් සහ ත්‍රස්තවාදී හේතූන් මත මියයන රාජ්‍ය සේවකයන් යන අයවලුන් සඳහා මරණ පාරිතෝෂික අංක ලබාදීමේ ක්‍රියාවලියද සිදුවන්නේ වැන්දඹු අනත්දරු අංශය මඟිනි.

වසර 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතින් ආවරණය වන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ තහවුරු කිරීම සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචිය රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය මගින් සිදු කෙරේ.

### 02. 2. ගෙවීම් නියාමනය.

විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදු කරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම් වැනි එක්වරක් පමණක් සිදු කරන ගෙවීම් ද නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම ගෙවීම් නියාමනය යටතේ සිදු කෙරේ.

විශ්‍රාමිකයා වෙත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සහතික කිරීම "සත්කාර පියස" සම්මුඛ පරීක්ෂණය මගින් සිදු කරනු ලබන අතර ලියාපදිංචි අංශයේ අධීක්ෂණය යටතේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ වේ. විශ්‍රාමිකයා පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය අදාල ආයතනය විසින් නිකුත් කෙරෙන අතර, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට එය ඇතුළත් කර සනාථ කිරීම සිදුවේ. එසේ සනාථ නොවන අවස්ථාවලදී

එනම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් අදාල විශ්‍රාමිකයාගේ තොරතුරු තහවුරු කර නොගත් අවස්ථා වලදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශය මගින් දත්ත පද්ධතිය පරීක්ෂා කර එකී විශ්‍රාම වැටුප් ගෙවීම් නතර කිරීමට කටයුතු කරනු ලැබේ.

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ද උක්ත ගෙවීම් ක්‍රියාවලිය අනුව සිදුවන අතර මාසික ගෙවීම් අංශය විසින් අදාල ගෙවීම් මාසිකව සිදු කරනු ලැබේ.

එමෙන්ම විදේශගත විශ්‍රාමිකයින්ගේ හෝ විශ්‍රාම වැටුප් ගණනය කිරීම් විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් සිදුවන අතර මාසික ගෙවීම් අංශය විසින් අදාල ගෙවීම් නියාමනය සිදු වේ. මෙකී සියලුම මාසික ගෙවීම් විශ්‍රාමිකයින්ගේ පෞද්ගලික ගිණුම් වෙත සෘජුව බැර කිරීම සිදු වේ.

එක්වරක් පමණක් සිදුකරන ගෙවීම් අතරින් විශ්‍රාම පාරිතෝෂික ගෙවීම, පාරිතෝෂික ගෙවීම් අංශය මගින් සිදු කරනු ලබන අතර විශ්‍රාමිකයාගෙන් රජයට අයවිය යුතු අයවීම් ඇතොත් එකී අයවීම් අයකිරීම සිදුකර ඉතිරි මුදල් විශ්‍රාමිකයාගේ ගිණුමට බැර කිරීම එහිදී සිදු වේ. එමෙන්ම මරණ පාරිතෝෂික ගෙවීම් සඳහා වන කාර්යභාරය වැන්දඹු හා අනත්දරු අංශයෙන් සිදුකරනු ලැබේ.

විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත්වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම පිළිබඳ කටයුතු ලියාපදිංචි අංශයෙන් හා ගණන් බැලීම් අංශයෙන් සිදු වේ. විශේෂ වන්දි ගෙවීම් සඳහා වන ගණනය කිරීම් ද ලියාපදිංචි අංශය මගින් සිදු කෙරේ. මෙම සියළු ගණනය කිරීම් වලට අදාලව කරනු ලබන ගෙවීම් නිසි අධීක්ෂණයක් හා කළමනාකාරිත්වයක් යටතේ විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම ගිණුම් අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ.

වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම් ක්‍රියාවලිය වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම් අංශය මගින් ද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගෙවීම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය මගින් ද සිදුවන අතර වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධ ගිණුම් පවත්වා ගැනීම ගිණුම් අංශයේ කාර්යභාරය වේ.

### 02. 3. ලැබීම් නියාමනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාවලි අතර ලැබීම් නියාමනය ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර මෙම කාර්යය වැන්දඹු හා අනත්දරු අරමුදල් ලැබීම් නියාමනය, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් නියාමනය හා ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය ලෙස කාණ්ඩ තුනක් ඔස්සේ විග්‍රහ කළ හැකිය.

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත සහ වැන්දඹු හා අනත්දරු අරමුදල් සන්නද්ධ සේවා පනත යන පනත් ප්‍රකාරව අදාල දායකයන්ගේ දායක මුදල් අයකර ගැනීම සිදු වේ. එහිදී ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීක මට්ටමේ නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 6% ක් ද තෘතීක මට්ටමේ හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගෙන් 7% ක් ද වැන්දඹු හා අනත්දරු දායක මුදලට බැර කිරීම සිදුවේ. මධ්‍යම රජයේ ආයතන හර සටහන් මගින් සෘජුවම මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට අදාල අරමුදල් බැර කිරීම සිදු කරන අතර පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් චෙක්පත් මගින් අදාල අරමුදල් ගෙවීම සිදු වේ. වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම සඳහා මෙම මුදල් භාවිතා වන අතර වැන්දඹු හා අනත්දරු අංශය විසින් අදාළ ලැබීම් නියාමනය සිදු කරනු ලැබේ.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබූ නිලධාරීන්ගේ වැටුපෙන් අයවන 8% ක දායක මුදලත්, සාමාජිකයා සේවය කරන ආයතනය විසින් ගෙවනු ලබන 12% ක දායක මුදලත් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල වෙත බැර වේ. අරමුදල් ආපසු ගෙවීම සඳහා අවශ්‍ය මුදල් හැර අනෙක් සියලු මුදල් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරනු ලබන අතර එයින් ලැබෙන පොලී අනුපාතයන් ද සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ලෙස ලබාදීම සිදු වේ. මෙකී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්

නියාමනය කිරීම සිදු වන්නේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය විසිනි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ලැබීම්වල තුන්වැනි කාණ්ඩය වන්නේ ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම්ය. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ලේ දෙපාර්තමේන්තුව ප්‍රයෝජනයට නොගන්නා ඉඩ ප්‍රමාණයන් වෙනත් ආයතන වෙත කුලී පදනම මත ලබාදී ඇති අතර එමගින් මාසිකව ආදායම් රැස් කිරීම සිදු කරනු ලැබේ.

එමෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික ප්‍රජාව ඇතුළු සමස්ත මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතනවලින් ද මාසිකව ආදායම් උපයනු ලැබේ. හෙක්ටයාර 3.0575 ක භූමි භාගයක පිහිටා ඇති කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයෙන් නිවාස, කාමර පහසුකම්, දේශන ශාලා පහසුකම් සහ භෝජනාගාර පහසුකම් සහන මිලක් යටතේ ලබාදෙනු ලැබේ. හෙක්ටයාර 0.1427 ක භූමි භාගයක පිහිටි රම්බොඩ නිවාඩු නිකේතනය ද විශ්‍රාමික ප්‍රජාව මෙන්ම දේශීය හා විදේශීය සංචාරකයින් වෙත නවාතැන් පහසුකම් සපයනු ලබන අතර එමගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ආදායම් රැස්වේ. එකී ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන මගින් ලැබෙන ආදායම් නියාමනය කරනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ පාලන අංශය විසිනි.

## 02. 4. සංවර්ධන ප්‍රවේශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සංවර්ධන ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් මානව සම්පත් සංවර්ධනය, තොරතුරු තාක්ෂණික සංවර්ධනය, විෂය සංවර්ධනය හා භෞතික සම්පත් සංවර්ධනය යන සිව් වැදෑරුම් මානයන් ඔස්සේ විග්‍රහ කළ හැකි ය.

දෙපාර්තමේන්තුව සතු ප්‍රධානතම සම්පත වන මානව සම්පත සංවර්ධනය කිරීම උදෙසා පාලන හා සුබසාධන අංශය මගින් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සිදුවේ. එහිදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ හා නව ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන කිරීම් විෂය මූලික වැඩසටහන් ද ආකල්ප හා කුසලතා සංවර්ධන වැඩසටහන් ද අභ්‍යන්තර පුහුණු හා බාහිර පුහුණු වැඩසටහන් වශයෙන් සංවිධානය කෙරේ. මෙහිදී විවිධ සම්පත් දායකයන් හා ආයතන සම්බන්ධ කරගෙන මෙකී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම දෙපාර්තමේන්තුගත මානව සම්පත, සම්පත්දායකයන් ලෙස යොදා ගනිමින් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව වෙනත් ආයතන දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමද මෙම අංශයේ විෂය පථය යටතේ සිදු කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණය අතින් ලෝකයේ විවිධ ක්ෂේත්‍රයන් සීඝ්‍ර වේගයකින් ගමන් ගන්නා ඉදිරි ගමනට සමගාමීව යාවත්කාලීන වෙමින් විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ද ලෝකයේ තොරතුරු තාක්ෂණික නව ගමන්මග සමග යාවත්කාලීන කරමින් නව අත්හදාබැලීම් ඇසුරින් නවීන ක්‍රමෝපායන් හඳුන්වාදීම දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදු කෙරේ. මාර්ගගත දත්ත පද්ධති හඳුන්වාදීම මෙන්ම ඒවා යාවත්කාලීන කිරීම ද, නිල වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාමද තොරතුරු තාක්ෂණ අංශයේ ඍජු නියාමනය සමග සිදු කෙරේ.

තොරතුරු තාක්ෂණික සංවර්ධනය සමග තොරතුරු සන්නිවේදන කටයුතු නවීන තාක්ෂණික උපක්‍රම ඔස්සේ සිදුකිරීම දෙපාර්තමේන්තු මාධ්‍ය ඒකකය මගින් සිදුවේ. එහිදී නිල වෙබ් අඩවිය, නිල Facebook පිටුව, නිල youtube නාලිකාව, වෙබ් සඟරාව හා විශ්‍රාම රේඩියෝව යන මාධ්‍යන් ඔස්සේ තොරතුරු යාවත්කාලීන කිරීම ද බාහිර මාධ්‍ය ආයතන වෙත තොරතුරු ලබාදීම ද මාධ්‍ය ඒකකය මගින් සිදු කෙරේ.

විශ්‍රාම වැටුප් විෂය, පවතින සමාජයීය තත්ත්වයන් යටතේ යාවත්කාලීන කිරීම හා විෂය මූලිකව පවතින ගැටලු නිරාකරණය කිරීම සිදුවන්නේ ප්‍රතිපත්ති හා නීති අංශය මගිනි. එහිදී විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, නව චක්‍රලේඛ නිකුත් කිරීම හා ප්‍රතිපත්තිමය ගැටළු විසඳීම, විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික ක්‍රියාමාර්ග සඳහා ක්‍රියාත්මක වීම යන විෂය සංවර්ධන ක්‍රියාවලි දියත් කිරීම ප්‍රතිපත්ති හා නීති අංශය මගින් සිදු කෙරේ.

එමෙන්ම දෙපාර්තමේන්තුව තුළ කාර්ය මණ්ඩලය සඳහා මෙන්ම සේවාලාභී විශ්‍රාමික ප්‍රජාව සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් විවිධාකාරයේ භෞතික සංවර්ධනයන් ක්‍රියාත්මක කිරීම පාලන හා සුබසාධන අංශය මගින් සිදු කෙරේ. එහිදී දෙපාර්තමේන්තු අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය යන ද්විත්වයම සංවර්ධනය කිරීම හා නිසි පරිදි නඩත්තු කිරීම සිදු කෙරේ.

## 02.5. පසු විපරම

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණනයට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක සිවිල්, වැන්දඹු හා හමුදා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයන් සිදු කර ඇත. එමගින් 2018 වර්ෂයට පෙර සිට ගෙවනු ලබන ජීවන වියදම් දීමනා, අන්තර් දීමනා, මූලික වැටුප් හා වැටුප් පරිවර්තන කිරීමේදී වරින් වර විවිධ පාර්ශවයන් සම්බන්ධයෙන් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත නැවත ගණනය කිරීම් වලදී විශ්‍රාමිකයන්ට වැඩිපුර ගෙවා තිබූ රුපියල් මිලියන 48ක මුදල් ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට හැකිවී තිබේ. එසේ අනාවරණය වූ අධි ගෙවීම් නිවැරදි කිරීමට හා අය කර ගැනීමට කටයුතු කිරීම තුළින් රාජ්‍ය අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තු වගකීම නිසි පරිදි ඉටු කිරීමට හැකියාව ලැබී තිබේ.

වැඩිපුර ගෙවනු ලැබූ ගෙවීම් අනාවරණය වූ පසු, නිවැරදි කිරීමට කටයුතු කිරීම තුලින්, වාර්ෂිකව සිදුවන වැඩිපුර ගෙවනු ලැබ ඇති විශ්‍රාම වැටුප් ප්‍රමාණයන් අඩුකර ගැනීමට හැකිවී ඇත. මීට අමතරව විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි හා පෙත්සම් සම්බන්ධයෙන් ද කරනු ලබන විශේෂ විගණන පරීක්ෂණ තුළින් තොරතුරු නිසි පරිදි ඉදිරිපත් නොවීම හෝ වසන් කිරීම නිසා සිදු වූ වැඩිපුර හා සුදුසුකම් නොලත් ගෙවීම් වළක්වා ගැනීමට ද, එම මුදල් අයකර ගැනීමට ද හැකියාව ලැබී තිබේ.

සමාලෝචන වර්ෂය තුළ විශ්‍රාම වැටුප් ගෙවීම හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් කරන ලද විගණන පරීක්ෂණයන්හිදී විගණන විමසුම් 44ක් ඉදිරිපත් කර ඇත. මෙම විගණන විමසුම් 44න් වර්ෂය තුළ විගණන විමසුම් 37ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ඉදිරිපත් කර ඇති අතර තවදුරටත් විගණන විමසුම් 7ක් සඳහා පිළිතුරු සකස්කර ඉදිරිපත් කල යුතුව තිබිණි.

## 03. වාර්ෂික වැඩසටහන්

### 03. 1. ජාතික විශ්‍රාමික දින සැමරුම

ශ්‍රී ලාංකික විශ්‍රාමික ප්‍රජාව රාජ්‍ය සේවය වෙනුවෙන් කරනු ලැබූ සුවිශේෂී කැපවීම අභිමානයෙන් සිහිපත් කරමින් සෑම වසරකම ඔක්තෝම්බර් 08 වැනි දිනට යෙදුණු "ජාතික විශ්‍රාමික දිනය" 2018 වසරේදී ද උත්කර්ෂවත් ලෙස සැමරීමට අවශ්‍ය කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලැබිණි. දිවයිනේ සියලුම විශ්‍රාමික ප්‍රජාව නියෝජනය වන පරිදි පළාත් නවය නියෝජනය කරමින් කළුතර, මහනුවර, අම්පාර, රත්නපුර, යාපනය, පොළොන්නරුව, පුත්තලම, මාතර සහ බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සම්බන්ධීකරණයෙන් අදාල සැමරුම් උත්සව සංවිධානය කරනු ලැබීය.

විශ්‍රාමික ප්‍රජාව වෙත මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලියෙන් ඔබ්බට සමාජ, ආර්ථික සුරක්ෂිතභාවය වෙනුවෙන් ජාතික මට්ටමේ කතිකාවක් ගොඩනැංවීම අරමුණු කර ගනිමින් මෙවර ජාතික විශ්‍රාමික දිනය සංවිධානය වූයේ "දිවියට නව අරුණක් " යන සුවිශේෂී තේමාවෙනි.



ඒ ඒ පළාත් සඳහා විශේෂ වන අයුරින් විද්වත් දේශන, වැඩමුළු, සෞඛ්‍ය කඳවුරු ආදී සුබසාධන සේවාවන් රැසක් විශ්‍රාමිකයන් වෙනුවෙන් සංවිධානය වී තිබූ අතර විශ්‍රාමික දින උළෙලට සහභාගි විය නොහැකි ශාරීරික අපහසුතාවයන්ගෙන් යුතු ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික ප්‍රජාවට ගෞරව දැක්වීම සඳහා ඔවුන්ගේ නිවෙස් වෙතම ගොස් ප්‍රණාම දැක්වීම ද ප්‍රාදේශීය මට්ටමින් දිස්ත්‍රික්ක කිහිපයකදී සිදු කිරීම මෙවර උළෙලේ විශේෂත්වයක් විය.

නිර්මාණශීලී කලා කෞශල්‍යයන් එළි දක්වමින් විශ්‍රාමිකයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ වින්දනාත්මක වැඩසටහන් වලින් වර්ණවත් වූ සැමරුම් උත්සව සංවිධානය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් ඇතුළු දිස්ත්‍රික් කාර්යාලයන්හි නිලධාරීන්ගේ මහා හැඟි දායකත්වය නොමඳව ලැබුණි. එමෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන වල මූල්‍ය අනුග්‍රහය මත ත්‍යාග සහ ප්‍රතිලාභ ලබා දෙමින් ජාතික විශ්‍රාමික දිනය ස්මරණීය දිනයක් බවට පත් කිරීමට නොමසුරු දායකත්වය ලබා දුන්හ.



### 03. 2. තාක්ෂණ සැසිය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ජාතික විශ්‍රාමික දිනයට සමගාමීව දෙවන වරටත් අති සාර්ථකව සංවිධානය කරනු ලැබූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු "තාක්ෂණ සැසිය - 2018 ", 2018.10.26 වන දින බත්තරමුල්ල වෝටර්ස් ඒජ්හි දී පැවැත්විණි.




රාජ්‍ය සේවයේ සියලුම රාජ්‍ය ආයතනයන් සමග සහසම්බන්ධතාවයක් ඇති ප්‍රමුඛ පෙළේ දෙපාර්තමේන්තුවක් වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ගෙවීම් ක්‍රියාවලියෙහි සහ මධ්‍යගත දත්ත පද්ධතිය ආශ්‍රිතව සිදු කෙරුණු නවීන වෙනස්කම් සහ යාවත්කාලීන වීම් පිළිබඳ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි ඉහළ පරිපාලනය දැනුවත් කිරීමේ අරමුණින් තාක්ෂණ සැසිය - 2018 සංවිධානය කරනු ලැබිණි.

විශ්‍රාම වැටුප් ගෙවීම් පද්ධතිය ආශ්‍රිතව තවදුරටත් සිදුවිය යුතු යාවත්කාලීන වීම් සහ වැඩිදියුණු වීම් පිළිබඳ රජයේ ඉහළ නිලධාරීන්ගේ යෝජනා හා අදහස් ලබා ගැනීමේ විද්වත් කතිකාවක් ලෙස තාක්ෂණ සැසිය - 2018 සංවිධානය කරනු ලැබුවේ "Sustainable Digitization of Pension Services" යන තේමාව පෙරදැරිවය. මෙම අවස්ථාවෙහි ප්‍රධාන දේශනය මහාචාර්ය එච්.ඩී.කරුණාරත්න මහතා විසින් පැවැත්වූ අතර ජපානය මූලික කර ගනිමින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වෙන රාජ්‍ය සේවකයින්ගේ විශ්රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදයන්හි අන්තර්ජාතික ප්‍රවණතා පිළිබඳවත් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු ශ්‍රී ලාංකික විශ්‍රාම වැටුප් ක්‍රියාවලියෙහි ඇතිවිය යුතු නව ප්‍රවණතාවයන් පිළිබඳවත් සාකච්ඡාවට ලක් කරන ලදී. විගණන කොමිසමේ සභාපති සහ විගණකාධිපති එච්.එම්.ගාමිණී විජේසිංහ මහතා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු තාක්ෂණ සැසියෙහි විශේෂ දේශනයක් පවත්වමින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගවීම පිළිබඳව අවධාරණය කරන ලදී. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි නිල වෙබ් අඩවිය අන්තර්ජාලයට මුදා හැරීම විදෙස් විශ්‍රාම වැටුප් ක්‍රමය මාර්ගගත කිරීම, පොදු 55 ආකෘති පත්‍රය මාර්ගගත කිරීම, හැඳුනුම්පත් පිටපත් කිරීමේ නව මුද්‍රණ යන්ත්‍රය හඳුන්වාදීම ආදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාමික ප්‍රජාව වෙත සැලසෙන නවතම සේවාවන් දියත් කිරීම ද තාක්ෂණ සැසියට සමගාමීව සිදු කරනු ලැබිණි.

ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍ය රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා හා අමාත්‍යාංශ ලේකම් පද්මසිරි ජයමාන්න මහතා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ආදී රජයේ ඉහළ නිලධාරීන් සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා නිරන්තරයෙන් සම්බන්ධ වන පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින් ද මෙම අවස්ථාවට සහභාගි විය.



### 03. 3. අභ්‍යන්තර පුහුණු සහ විදෙස් පුහුණු අවස්ථා කළමනාකරණය

දිවයින පුරා වෙසෙන ලක්ෂ හයකට අධික විශ්‍රාමික ප්‍රජාව වෙත මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය නිරවද්‍යතාවයෙන් සහ ගුණාත්මකභාවයෙන් යුතුව කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම උදෙසා සක්‍රිය කාර්යභාරයක දෙපාර්තමේන්තුවේ ඉහළ සිට පහළ දක්වා විහිදුණු ධූරාවලියෙහි සෑම නිලධාරියෙකුම නිරත වේ. එම නිසා මානව සම්පත ආයතනය සතු වටිනාම සම්පත ලෙස සළකන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විවිධ පුහුණු වැඩසටහන් කළමනාකරණය කරමින් සිය නිලධාරීන් සතු දැනුම සහ ශක්‍යතාවන් වැඩිදියුණු කිරීමට ක්‍රියාකරනු ලබයි. 2018 වසරේදී දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් බහුතරයක් විවිධ පුහුණු අවස්ථාවන් සඳහා යොමු වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

2018 වසරේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට එක් වී දෙපාර්තමේන්තුවට පැමිණි නවක නිලධාරීන් 53 දෙනෙකු වෙත 2018.05.15 සිට 2018.06.01 දක්වා සති දෙකක කාල සීමාවක් සේවාරම්භක පුහුණුවක් ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. 2018.07.07 සිට 2018.07.22 දක්වා සති අන්ත දිනවලදී ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා දෙමළ භාෂා පුහුණුවක් ද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට පත්වීම් ලැබ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරනු ලැබූ දෙවන කණ්ඩායමෙහි නිලධාරීන් 18 දෙනෙකු වෙත 2018.10.19 සිට 2018.11.02 දක්වා සති දෙකක සේවාරම්භක පුහුණුවක් ලබා දීමට ද කටයුතු කෙරිණි. කාර්යාල ක්‍රම ආයතන සංග්‍රහය සහ මහජන සම්බන්ධතාවය පිළිබඳ දෙපාර්තමේන්තුවේ ද්විතීයික මට්ටමේ නිලධාරීන් සතු දැනුම සහ ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් වැඩමුළුවක් 2018.12.08 හා 2018.12.09 දෙදින කැළණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේ දී පවත්වනු ලැබිණි. ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් 93 දෙනෙකු සහභාගී විය. 2018.12.14 හා 2018.12.15 යන දෙදින බැහැරගත පුහුණු වැඩසටහනක් (Outbound Training) සංවිධානය කරමින් නිලධාරීන් හට නායකත්ව පුහුණුව සහ පෞරුෂ සංවර්ධනය සඳහා විශේෂ ක්‍රියාකාරකම්වල යෙදීමේ අවස්ථාව ලබා දීමට පියවර ගන්නා ලදී. නිලධාරීන් 89 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් එම විශේෂ වැඩසටහන් සඳහා යොමු කරනු ලැබිණි.



දේපළ / උපකරණ සබැඳිව ස්ථාවර වත්කම් පවත්වා ගෙන යාම පිළිබඳව නිපුණතා සංවර්ධන අධිකාරිය මගින් 2018.07.17 වන දින පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන සඳහා ද දෙපාර්තමේන්තු නිලධාරීන් කණ්ඩායමක් සහභාගි විය. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් ගැටුම් කළමනාකරණය හා දුක් ගැනවිලි හැසිරවීම සම්බන්ධව රාජ්‍ය නිලධාරීන් වෙත ලබා දුන් පුහුණු අවස්ථාව සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් මාණ්ඩලික නිලධාරිනියක සහභාගි කරවනු ලැබුණි. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම, රියදුරන්ගේ කුසලතා වර්ධනය සහ සහායක කාර්යාල මණ්ඩල සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය යන තේමාවන් යටතේ පැවැත්වූ පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී කෙරිණි. Academy of Financial Studies ආයතනය මගින් පැවැත්වූ විනය ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණු වැඩසටහන ආදී වැඩසටහන් රාශියක් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී කරවමින් නවමු අත්දැකීම් ඔස්සේ නිලධාරීන්ගේ ආකල්ප සහ කුසලතා සංවර්ධනය කිරීමට 2018 වසරේදී ද දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය සැපයීමට ක්‍රියාකරන ලදී.



රාජ්‍ය ආයතන අතර ඉහළ ගුණාත්මක සේවාවක් සපයනු ලබන රාජ්‍ය ආයතනයක් වූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය අන්තර්ජාතික ප්‍රමිතියෙන් යුතුව පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර සමාජාරක්ෂණ ක්‍රියාවලීන් පිළිබඳ නිබඳවම අවධානය යොමු කරන දෙපාර්තමේන්තුවක් වේ. දෙපාර්තමේන්තුව වෙත පිරිනැමෙන වාර්ෂික විදේශ පුහුණු අවස්ථා එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කළමනාකරණය කරමින් 2018 වසරේ දී විදෙස් පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් යොමු කරනු ලැබීය. 2018.03.25 සිට 2018.04.02 දක්වා තායිලන්තයේ පැවැත්වුණු කළමනාකරණය පිළිබඳ PMI ජාත්‍යන්තර වැඩසටහන සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහභාගි කෙරුණු අතර 2018.04.25 හා 2018.04.26 දෙදින ජපානයේ පැවැත්වුණු රක්ෂණය සහ ආසියාවේ විශ්‍රාම ඉතිරිය සම්බන්ධ ADBI-JFSA-OECD හමුව සඳහා ද දෙපාර්තමේන්තු නිලධාරියකු සහභාගි කෙරුණේද ඒ අනුවයි. තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කිරීම උදෙසා වන මූල්‍ය සමාජ ආරක්ෂණය ශක්තිමත් කිරීම යන මැයෙන් 2018.05.15 සිට ජපානයේ පැවැත්වුනු සමුළුවට සහභාගි වීමට අවස්ථාව ලබාදීම ද දෙපාර්තමේන්තුව වෙත හිමිවුණු විශේෂ විදෙස් පුහුණු අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. ඉන්දියානු රාජ්‍ය අංශය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා 2018.07.30 සිට 2018.08.03 දක්වා පැවති සංචාරය සඳහා ද දෙපාර්තමේන්තුව නියෝජනය කළ අතර 2018.08.22 දින ජපානයේ පැවති පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි සඳහා වන පුහුණු වැඩසටහන සඳහා ද දෙපාර්තමේන්තුව නියෝජනය කරන ලදී. 2018.10.22 සිට 2018.10.26 දක්වා ඉන්දියාවේ පැවති රාජ්‍ය පරිපාලන සහ සංවර්ධන වැඩසටහන සඳහාත් එම තේමාවෙන්ම 2018.11.26 සිට 2018.11.30 දක්වා ඉන්දියාවේ පැවති පුහුණු වැඩසටහන සඳහාත් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී කරවනු ලැබීය.

### 03.4. දැනුම් කළමනාකරණය

විශ්‍රාම වැටුප් ලියාපදිංචිය මාර්ගගත කිරීම පිළිබඳව සහ වැන්දඹු හා අනත්දරු නැවත ලියාපදිංචි කිරීම පිළිබඳව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව යොමු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය හා සහසම්බන්ධව කටයුතු කරන 3000 කට අධික රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම, පුහුණු කිරීම සඳහා සම්පත් දායකයින් ලබා දෙමින් ඔවුන් කාර්යක්ෂමව තොරතුරු පද්ධතිය හා යා කර ගැනිණි.

මධ්‍යම රජයේ මෙන්ම පළාත් සභා, පළාත් පාලන ආයතනවලද නිලධාරීන් පුහුණු කිරීමේ පුහුණු වැඩසටහන් 19 ක් පමණ වර්ෂය මුළුල්ලේම පවත්වා ඇත.

එමෙන්ම විශ්‍රාම වැටුප් ක්‍රියාවලියේ නවීකරණයන් හඳුන්වාදීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ගණකාධිකාරීවරුන් පුහුණු කිරීම සඳහා 2018 වර්ෂය තුල පුහුණු වැඩසටහන් 03ක් පවත්වා ඇත. එසේම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ශ්‍රී ලංකා පදනම් ආයතනය වැනි රාජ්‍ය සේවක පුහුණුකිරීමේ ආයතන සඳහා විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු කිරීමට වරින් වර සම්පත් දායකයින් ලබාදීම සිදුකර ඇත.

පුහුණු වැඩමුළු පැවැත්වීමට අමතරව දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය ඔස්සේ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රදර්ශනය කිරීම මගින් ද මාර්ගගත ලියාපදිංචි කිරීම පිළිබඳ ගැටළු සඳහා රාජ්‍ය නිලධාරීන්ට ක්ෂණික විසඳුම් ලබාදීම මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණය මත පදනම්ව කරනු ලැබු නවීන හඳුන්වාදීම්

පිළිබඳව අනෙකුත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීමට පියවර ගනු ලැබීය.

### 03. 5. බැහැරගත ක්‍රියාකාරකම්

යාන්ත්‍රික ලෙස දෛනික රාජකාරි ඉටු කරන නිලධාරීන් පිරිසක් වෙනුවට කලාවට, සාහිත්‍යයට සහ විෂය බාහිර දැනුමට සංවේදී නිලධාරීන් බිහිකිරීම මගින් ඵලදායී රාජ්‍ය සේවයක් බිහිකළ හැකිය යන අරමුණින් කටයුතු කරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරිත්වය විසින් නිලධාරීන්ගේ කලා රසවින්දනය සංවර්ධනය කිරීම සඳහා 'Friday Forum' නම් සංකල්පය නිර්මාණය කරනු ලැබීය.




වසර ගණනාවක් පුරා ක්‍රියාත්මක කරන ලද 'Friday Forum' සංකල්පය උසස් කලා රසවින්දනයක් සහිත සංවේදී නිලධාරීන් පිරිසක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ නිර්මාණය කිරීමට මෙන්ම විවිධ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන් රැසකගේ ආභාෂය ලබා දීමට ද හැකි වූ සාර්ථක සංකල්පයක් ලෙස හඳුන්වා දිය හැකිය. දෙපාර්තමේන්තුවේ සියළුම අංශ නියෝජනය වන සේ මසකට වරක් උපරිම කැපවීමකින් යුතුව සංවිධානය කරනු ලබන 'Friday Forum' වැඩසටහන 2018 වසරේදී අතිශය සාර්ථක ලෙස පැවැත්වීමට කටයුතු කරන ලදී.

2018.01.26 දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සංවිධානය කරනු ලැබූ වසරේ ප්‍රථම 'Friday Forum' අත්දැකීම වූ 'ගී මල් විල' සංගීතමය වැඩසටහන දෙපාර්තමේන්තුවේ ගායන කෞෂල්‍යයෙන් හෙබි නිලධාරීන් රැසකගේ දක්ෂතා එළි දැක්වීමේ අවස්ථාවක් බවට පත් විය. කායික මානසික වශයෙන් නිරෝගී දිවියකට හෙළ වෛද්‍ය විද්‍යාවේ මඟ පෙන්වීම් පිළිබඳ නිලධාරීන් දැනුවත් කරමින් 'නිරෝගී දිවියක මග' මැයෙන් සංවිධානය කරනු ලැබූ 'Friday Forum' වැඩසටහන ආයුර්වේද විශේෂඥ වෛද්‍ය ඩී.එම්.තෙන්නකෝන් මහතා විසින් මෙහෙයවනු ලැබීය. ජ්‍යොෂ්ඨ රංගධර සනිස්වන්ද්‍ර එදිරිසිංහ මහතා 2018.04.20 දින 'Friday Forum' තුළින් උසස් මානසික තත්ත්වයන් පවත්වා ගැනීම සඳහා සාරවත් සිතුවිලි ඇති කරගැනීමෙහිලා වැදගත්කම පිළිබඳ හරවත් දේශනයක් පවත්වනු ලැබීය. 2018.06.22 වන දින පොලිස් පරීක්ෂක මනෝජ් සමරනායක මහතා විසින් 'ශ්‍රී ලංකාවේ ළමා අපචාර පිළිබඳ වර්තමාන තත්ත්වය' තේමාවෙන් ද 2018.10.12 පාරම්පරික වෛද්‍ය ශ්‍යාමා ප්‍රනාන්දු මහත්මිය විසින් 'පාරම්පරික ඔසුවෙන් නිරෝගී දිවියක්' යන තේමාවෙන් ද 'Friday Forum' මෙහෙයවන ලදී. රසිකත්වය මාධ්‍ය භාවිතය හා ජීවිතය පිළිබඳ 2018.11.09 දින 'Friday Forum' හිදී සංවාදයට බඳුන් කෙරුණු අතර මෙහෙයවූයේ ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි මහතා විසිනි. 2018.12.07 දින පැවැත්වූ 'Friday Forum' වැඩසටහන ජනගායන වාදන නෘත්‍ය අංගයන්ගෙන් යුතු ආකර්ශණීය අත්දැකීමක් බවට පත්විණි. 'ජන සංගීතය හා බැඳුණු අපේකම' මැයෙන් එම විශේෂ 'Friday Forum' වැඩසටහන මෙහෙයවූයේ ප්‍රවීන කලාකරු සහන් රන්වල මහතා ඇතුළු රන්වල පදනමේ කලාකරුවන්ගේ ප්‍රධානත්වයෙනි.



එකිනෙකට වෙනස් තේමාවන්ගෙන් යුතුව සංවිධානය කරනු ලැබූ 'Friday Forum' වැඩසටහන් සියල්ලටම දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉහල ප්‍රතිචාර හිමි වූ අතරම එමගින් රාජකාරි දිවිය පවත්වා ගෙනයාම සඳහා විශාල ප්‍රබෝදයක් ලැබී තිබිණි.

## 04. නව හඳුන්වාදීම්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ පවත්නා ක්‍රමවේදයන් සහ පවතින තත්ත්වයන් වැඩිදියුණු කරමින් විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය තව තවත් වැඩිදියුණු කිරීම 2018 වසර තුළදී සිදුවිය.

### 04. 1. භෞතික වැඩිදියුණු කිරීම

අලුතින් විශ්‍රාම දිවියට එක් වන සියලු නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන සත්කාර පියස විශ්‍රාමිකයන්ගේ කටයුතු වඩාත් පහසුවෙන් ඉටුකරදිය හැකිවන ආකාරයෙන් නවීකරණය කර ඇත.

එහිදී පිළිගැනීමේ කවුළු සඳහා නවතම ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 03 ක් ලබාදීමත් සත්කාර පියස සඳහා මේස පුටු ලබාදීම හා ලිපි ලේඛන පවත්වාගෙන යාම සඳහා කබඩ් ලබාදීමත් සිදු කරන ලදී.

නිලධාරීන්ගේ හා විශ්‍රාමිකයන්ගේ කාර්යය පහසු කිරීම සඳහා දෙපාර්තමේන්තුව තුළ මහජන බැංකු ATM යන්ත්‍රයක් ස්ථාපිත කිරීම ද මෙම කාලවකවානුව තුළ සිදු කරන ලද ප්‍රධාන කාර්යයකි.

නිලධාරීන්ගෙන් වඩාත් ඵලදායී සේවාවක් අපේක්ෂාවෙන් ඔවුන්ගේ රාජකාරි පරිසරය නවීකරණය කිරීමත් රජයේ විගණන අංශය, විෂමතා අංශය හා දායක මුදල් අංශය දෙපාර්තමේන්තු තුන්වන මහලේම නවීකරණය කරන ලද වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමත් සිදු කරනු ලැබිණි. තොරතුරු තාක්ෂණ අංශය හා සංවිධාන සංවර්ධන අංශය නවීකරණය කර එකී බිම් වපසරියේ ඉඩ භාවිතා කරමින් රැස්වීම් කාමරයක් නිර්මාණය කරනු ලැබු අතර, අභ්‍යන්තර විගණන අංශය නවීකරණය කර දෙපාර්තමේන්තුව තුළ මහල් කිහිපයක කොටස් කීපයක් වශයෙන් පැවති වැන්දඹු හා අනත්දරු සහ සිවිල් ලේඛනාගාරය පස්වැනි මහලේ විධිමත් පරිදි ස්ථානගත කිරීමට ද හැකි විය.



එමෙන්ම විශ්‍රාමික සංගම් නියෝජිතයන්ට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමග සෘජුවම සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහා හා ඔවුන්ගේ කටයුතු පහසුවෙන් කරදීම සඳහා විශ්‍රාමික සංගම් සම්බන්ධීකරණ ඒකකය පළමු මහලේ ස්ථාපිත කරන ලදී.

තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් සිදුකරන සියළු නව හඳුන්වාදීම් වලට සරිලන පරිදි නව ස(ර්)වර් යන්ත්‍රයක් මිලදී ගැනීම ද සිදු විය.

2018 වසර තුල කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ ආරක්ෂිත වැට හා ආවරණය නොවූ කොටස ආරක්ෂිත දැල් ආවරණයක් යොදා පිළිසකර කිරීම ද ප්‍රමුඛතාවය ලබාදී සිදු කරන ලද කාර්යයකි.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහ දෙපාර්තමේන්තුවට පැමිණෙන සේවාලාභීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ආරක්ෂිත කැමරා පද්ධතිය නවීකරණය කිරීම හා ගිනි ආරක්ෂක පද්ධතිය යාවත්කාලීන කිරීම ද සිදු විය.

කාර්යාලය තුළ ප්‍රසන්න වටපිටාවක් ඇති කිරීම සඳහා සහ ඉඩ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ පරිහරණයට ගත නොහැකි භාණ්ඩ විධිමත් පරිදි අපහරණය කිරීම ද සිදු විය. තවද දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන පුද්ගලයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා Visitors Pass නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.



